# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2016/2 - 2017 අප්‍රේල් මස 24 වැනි සඳුදා - 2017.04.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

මධ්‍යම පළාතේ පළාත් සභාව 2014 අංක 1846/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකර ඇති ගාස්තු සංශෝධනය කිරීම

මධ්‍යම පළාත් සභාවේ මාර්ග සංවර්ධන ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය එදිරිවීර වීරවර්ධන වන මම වර්ෂ 1992 අංක 4 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහනය කිරීමේ ප්‍රඥප්තියේ 24 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව, පිළිවෙලින් 2013 ජනවාරි මස 21 වැනි දිනැති සහ 2014 ජනවාරි මස 20 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රවල* පල කර ඇති මාර්ග බලපත්‍ර ගාස්තු සහ A, B, C, D සහ E වශයෙන් වර්ගීකරණය කරන ලද ඒ ඒ මාර්ගවලට අවම තක්සේරු වර්ගීකරණ ගාස්තු සහ සිසු සැරිය පාසල සේවාවට පමණක් අවසර පත්‍ර හිමි බස්රථ සඳහා ගාස්තු පහත සඳහන් පරිදි සංශෝධනය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

සංශෝධන ගාස්තු අය කිරීම 2017.01.01 දින සිට ක්‍රියාත්මක වේ.

| *කාරණය* | *පෙර පැවති ගාස්තු* | *සංශෝධිත ගාස්තු* |
|---|---|---|
| බලපත්‍ර ගාස්තු - | | |
| සාමාන්‍ය සේවා | රු. 4,500.00 | රු. 7,500.00 |
| ආසන 14ට අඩු වෑන් රථ | රු. 4,500.00 | රු. 5,000.00 |
| සුඛෝපභෝගී සේවා | රු. 7,500.00 | රු. 10,000.00 |
| වර්ගීකරණ ගාස්තු - | | |
| A - මාර්ග | රු. 150,000.00 | රු. 200,000.00 |
| B - මාර්ග | රු. 130,000.00 | රු. 175,000.00 |
| C - මාර්ග | රු. 100,000.00 | රු. 150,000.00 |
| D - මාර්ග | රු. 70,000.00 | රු. 80,000.00 |
| සිසු සැරිය පාසල් ළමුන් ප්‍රවාහන සේවාවට පමණක් ලබාගෙන ඇති බලපත්‍ර සඳහා ගාස්තු - | | |
| අයිතිය සංශෝධනය | රු. 10,000.00 | |
| මාර්ග සංශෝධනය | රු. 10,000.00 | |
| අංක සංශෝධනය | රු. 10,000.00 | |

එදිරිවීර වීරවර්ධන,
මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති හා
නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය,
මධ්‍යම පළාත.

05-201

1A PG 3499 — 22 (2017/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*